# 21 සිරිහීම මග හරිමු දියුණුවට පිය නගමු

සඳුද උදය පාසල් රැස්වීම ඇමතූ විදුහල්පතිතුමා පවසා සිටියේ, ලබන සතිය තුළ පාසල් පාර්ලිමේන්තුව සඳහා සභිකයන් තෝරා පත් කර ගන්නා බවත්, ඒ සඳහා අට වැනි ශ්‍රේණියෙන් ඉහළ පන්තිවල සිසුන්ට ඉල්ලුම් කළ හැකි බවත් ය. මේ සතියේ සිකුරාදට පෙර තම සුදුසුකම් සහිත ඉල්ලුම්පත් නියෝජ්‍ය විදුහල්පතිතුමාට භාර දිය යුතු බව ද එතුමා වැඩි දුරටත් දන්වා සිටියේ ය.

පාර්ලිමේන්තුව සඳහා සභිකයන් 60 දෙනකු පත් කර ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ඉල්ලුම්පත් රැසක් ලැබිණි. නියමිත දිනට ඡන්දය සූදානම් කෙරිණි. ඡන්දය දීමේ අයිතිය විද්‍යාලයේ හත් වැනි ශ්‍රේණියෙන් ඉහළ සිසුන්ට ලැබිණි. නියමිත දින ඡන්දය පවත්වා සභිකයන් තෝරා පත් කර ගන්නා ලදි. මංගල පාර්ලිමේන්තුව රැස් වුණේ සිකුරාද පස්වරුවෙහි ය. අපේ රටේ පාර්ලිමේන්තුවේ ආකාරයට ම ආසන සකස් කර තිබිණි. සභිකයන් අසුන් ගත් පසු, නියෝජ්‍ය විදුහල්පතිතුමාගෙන් උපදෙස් ලැබුණේ කථානායකවරයකු පත් කර ගැනීමට ය. සභාවේ ඒකමතික තීරණයට අනුව "ජීවන්ත" තේරී පත් වූයේ අත් පොළසන් හඬ මැද ය. කථානායක ආසනය වෙත ඔහු කැඳවා ගෙන ගියේ ඡන්දයෙන් වැඩි මනාප ලබා ගත්, ඉසුරු සහ මුදිතයි. පාර්ලිමේන්තුවේ අනෙක් තනතුරු ද පත් කර ගත් පසු, කථානායකතුමා මංගල සභාව ඇමතුවේ, පද්‍ය ගායනයකිනි.

නිතර නිතර රැස්වෙමු
නිති සමගිය පතුරමු
නීති රීති සුරකිමු
වැඩිහිටියන් නමදිමු

කුලවමියන් රකගමු
පුද සිරිතෙන් සරුවෙමු
යතිඳුතුමන් සුරකිමු
වජ්ජීන් මෙන් හැසිරෙමු

"ගරු මන්ත්‍රීවරුනි,

අපට අද ඉතා වැදගත් දිනයක්. මා හිතන ආකාරයට අද පාසල් ඉතිහාසයේ නව පරිච්ඡේදයක් ලියැවුණු දවසයි.

අප ඉගෙන ගෙන තිබෙන, අසා තිබෙන පාර්ලිමේන්තුවේ ස්වභාවයට ම විද්‍යාලය තුළ ශිෂ්‍ය අපගේ පාර්ලිමේන්තුවක් ආරම්භ කිරීම, අපගේ ඉගෙනීමේ කටයුතු දියුණු කර ගැනීමට මහත් රුකුලක්. අපි එකතු වෙලා සමගියෙන් අපේ දියුණුවට විද්‍යාලයයේ දියුණුවට මහත් සේවයක් කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රීවරුනි,

අපේ වැදගත් කටයුතුවල දී අපට ඉහළ ම ආදර්ශ ලැබෙන්නේ බුද්ධ චරිතයෙන්, බුද්ධ ධර්මයෙන් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින්. ඒ නිසා අපේ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමක් කෙරෙහි ඔබේ අවධානය පළමු ව ම යොමු කරවන්න කැමතියි.

බුදුරජාණන් වහන්සේ දිනක් රජගහ නුවර ගිජ්ඣකූට පර්වත මුදුනේ වැඩ සිටියා. ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හාමුදුරුවෝ තථාගතයන් වහන්සේ අසල අප්‍රමාණ ගෞරවයෙන් ශ්‍රද්ධාවෙන් යුක්ත ව පවන් සලනවා. මගධාධිපති අජාසත් රජුගේ නියමයෙන් ඔහුගේ ප්‍රධාන ඇමැති වස්සකාර, භාග්‍යවතුන් වහන්සේ හමු වීමට පැමිණියේ ඒ අතර තුරයි.


වස්සකාර ඇමැති පැමිණියේ තම රාජ්‍යය යුද්ධයකට සූදානම් වන බව ප්‍රකාශ කරන්නට. අජාසත් රජු වජ්ජි රාජ්‍යය සමග සටනට යන බව කියන්නට. තථාගතයන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් මෙහෙම විමසනවා.

**" ආනන්දයෙනි, වජ්ජීහු නිරතුරුව රැස්වෙත් ද? සමගි ව රැස් වී සමගි ව කටයුතු කර සමගියෙන් විසිර යත් ද? නොපැන වූ නීති නොපනවා පැනවූ නීති කඩ නො කරත් ද? වැඩි හිටියන්ට ගරු බුහුමන් කරත් ද? ඔවුන්ගේ අවවාද අනුශාසනා පිළිපදිත් ද? කුලකාන්තාවන්ට හිරිහැර පීඩා හිංසා නො කරත් ද? ආගමික පූජනීය ස්ථානවලට ගරු කරත් ද? ඒවා නඩත්තු කරත් ද? රහතන් වහන්සේලා තම රාජ්‍යයට වැඩම කරවා ගෙන ආරක්ෂාව සලසත් ද?" මේ සියල්ල පිළිපදින බව ආනන්ද තෙරුන් පැවසුවා. එසේ නම් වජ්ජීන්ට දියුණුවක් මිස පරිහානියක් නො වන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

" බොහොම හොඳ පිළිවෙත් සමූහයක්. මෙම පිළිවෙත් නිසා මොවුන් යුද්ධයකින් නම් පරාජය කළ නො හැකි යැයි සිතූ වස්සකාර භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කර ආපසු යන්නට ගියා......."

ගරු මන්ත්‍රීවරුනි,

මේ අපරිහානීය ධර්ම වජ්ජීන්ට ඉගැන්වූයේ බුදුරජාණන් වහන්සේමයි. දැන් අපි සාකච්ඡා කර බලමු අපට, අපේ පාර්ලිමේන්තුවට, මෙම උතුම් පාලන පිළිවෙත්, සම්බන්ධ කර ගන්නේ කෙසේ ද කියලා.



ගිජ්ඣකූට පර්වතයේ බුදුරදුන් වැඩ සිටි ස්ථානය

අපේ සභාවට, ආයතනයට පමණක් නො වෙයි, ඕනෑම ආයතනයකට, සමාජයකට මේවා ඉවහල් කරගෙන දියුණුව කරා ළඟා විය හැකියි.

නිතර නිතර රැස්වීම, පැන නැගෙන ගැටලු නිරාකරණය කර ගැනීමට මහත් රුකුලක් වෙනවා. රැස් නොවනතාක් අප ආයතනවල ඇති අඩුපාඩු මකා ගන්න ප්‍රශ්න නිරාකරණය කර ගන්න පුළුවන් වන්නේ නෑ. දින පහළොවකට වරක් සම්මත සීමාවකට ගණ පූරණය සහිත ව රැස් වී, මූලික විනය ශික්ෂා සිහිපත් කර ගැනීමටත්, ඒවා කඩ කළ භික්ෂූන් ගැන විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට අනුදැන වදරා තිබෙනවා. සමගියෙන් රැස්වීම හා විසිර යෑම අප සැමගේ ම දියුණුවටත් සතුටටත් හේතු වෙනවා. මම අහලා තියෙනවා භික්ෂූන් වහන්සේලා අසමගි වූ එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ දුන් අවවාදයක්.

**"සමග්ගා හෝථ මා විවදථ"**
**" සමගි වන්න. වාද විවාද නො කරන්න"**

සමගි ව කටයුතු කිරීමේ ප්‍රතිඵලය තමයි, සාමය ඇති වීම! "සමගි වූවන්ගේ තපස සැපයක්" බව බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා.

යම් ආයතනයක යහපත් පැවැත්මට නීතිරීති අවශ්‍යයි. ආයතනයෙන් ආයතනයට නීති සම්ප්‍රදයයන් වෙනස් විය හැකියි. අපේ පාසලට යම් නීති හා සම්ප්‍රදයයන් තියෙනවා වගේ ම, ඒ ඒ ආයතන පවත්වා ගෙන යෑමට අදාළ නීතිරීති තියෙනවා. පනවා ඇති නීති බිඳ දැමුවහොත්, එයින් සිදු වන්නේ පිරිහීමයි."

වැඩිහිටියන්ගේ අදහස් පිළිපැදීම අපේ දියුණුවට මහත් පිටිවහලක්. ශීලාදී ගුණ දහමින් වැඩිහිටියන් වන්නේ අපේ මහා සංඝරත්නයයි. උන් වහන්සේලාගේ උපදෙස් අපේ දියුණුවට බෙහෙවින් අවශ්‍ය වෙනවා. වටිනවා. අපේ දෙමාපියන්, ගුරුවරුන්, ආදි ගුණ නුවණින් හෙබි වැඩිහිටියන්ගේ උපදෙස් තුළින් අනාගතය දියුණු වෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කළ වෘද්ධ අපචායනයේ හෙවත් වැඩිහිටියන් පිදීමේ එක් පැත්තක් තමයි ඒ අයට සවන් දීම, කීකරු වීම.

අපේ සමාජය ප්‍රධාන කොටස් දෙකකට බෙදන්න පුළුවන්. පිරිමි ගැහැනු වශයෙන්. භාග්‍යවතුන් වහන්සේ මේ පිරිස් දෙක නම් කළේ උපාසක, උපාසිකා වශයෙන් බව ඔබ දන්නවා. එහි උපාසිකා නම් වූ කාන්තා පිරිස රැක බලා ගැනීමත් අත්‍යවශ්‍ය කරුණක්. බුදුරජාණන් වහන්සේ පහළ වූ යුගයේ බ්‍රාහ්මණ ඉගැන්වීම් නිසා කාන්තාවන් නොයෙක් තාඩන පීඩනවලට ලක් වුණා. පිරිමින්ගේ වහලියන් වශයෙන්, ඔවුන්ට ගේ තුළට ම වී සිටීමට සිදු වුණා.

නමුත් තථාගතයන් වහන්සේගේ කාරුණිකත්වය නිසා, කාන්තාව උපාසිකා නාමයෙන් පිදුම් ලැබුවා. ඒ විතර ද? උතුම් භික්ෂුණී තත්ත්වය පවා ලබා ගැනීමට හැකි වී තිබෙනවා.

අපේ කාන්තාව පිරිමින් හා සම තැනක සිටිනවා. බුද්ධිමත් බවින්, රැකියාවෙන්, එසේ ම පරිපාලන හැකියාවෙන් ඉදිරියට ඇවිල්ලා. අපි අපේ කාන්තාවන් ආරක්ෂා කර ගත යුතුයි. ඔවුන් දෙස බැලිය යුත්තේ, ඔවුන්ට සැලකිය යුත්තේ කරුණාවෙන්, දයාවෙන්.

පුද්ගලයකු තුළ, ආයතන තුළ පවත්වා ගත යුතු ගුණ ධර්ම බොහොම වටිනවා. ඒ සඳහා ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති විය යුතුයි. තමන් අනුගමනය කරන, අදහන ගරු කරන දහම මිනිසාගේ අධ්‍යාත්මය සකස් කරනවා. සත්ත්වයන් අතර, උසස් මනසක් තියෙන මිනිසාට ඒ දියුණුව ලබා ගත හැකියි. මිනිසා ගුණ යහපත්කමින් දියුණු වූ තරමටයි, සමාජ දියුණුවක් ගොඩ නගා ගත හැක්කේ. නො පැරදී ඉදිරියට යා හැකි වන්නේ. සිල්වත්කම, ගුණයහපත්කම, නුවණ, දියුණු කර ගැනීමෙන් ම එය තව තවත් වර්ධනය කර ගත හැකියි. මේ සඳහා පූජනීය ස්ථානවලින් ලැබෙන මෙහෙය සුළු පටු නො වෙයි. ඒ නිසා අපේ යුතුකමක් තමයි, ඒ සියලු පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීම. ඒවා නඩත්තු කිරීම. ඒවා පවත්වා ගෙන යෑමට උදව් කිරීම. මේ නිසා අන්‍යෝන්‍ය ආගමික සහජීවනයක් ගොඩනැගෙනවා. සාමය, සමගිය ගොඩනැගෙනවා.

ආගමික ස්ථාන භාර ව කටයුතු කරන, අපට යහමග කියා දෙන, ඒ ඒ ගුණ ධර්ම ආරක්ෂා කරන ආගමික උතුමන්ට අවශ්‍ය පහසුකම් සපයා දීම, සංග්‍රහ කිරීම ඉතා වටිනා යුතුකමක්. මෙයින් සුහදත්වය ගොඩ නැගෙනවා. පුද්ගල දියුණුවත්, පුද්ගලයන් අතර යහපත් සබඳතා ගොඩ නගා ගැනීමත් සිදු වෙනවා.

මේ ආකාරයට සප්ත අපරිහානිය ධර්ම සමාජයේ පැවැත්මට, දියුණුවට, ඉදිරියට ගෙන යෑමට නොයෙක් අයුරින් උපකාරී වෙනවා. බුදුරජාණන් වහන්සේ, වජ්ජීන් අතර පැවති සප්ත අපරිහානීය ධර්ම මුල් කර ගෙන අපේ මහා සංඝරත්නයේ, ශාසනයේ යහපත් පැවැත්ම පිණිස දේශනා කළ අපරිහානීය ධර්ම රැසක් ද තිබෙනවා. අපේ ජීවිත පවත්වා ගෙන යෑමටත් ආයතනික දියුණුවටත් ඉවහල් වන එම ධර්ම ඇසුරෙන් මේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ, අපේ පාසලේ සහ අප සම්බන්ධ ආයතනවල යහපැවැත්මට අදළ නීතිරීති සහ සම්ප්‍රදායයන් ගොඩ නඟාගෙන ඒවාට අනුව කටයුතු කිරීමට අපි අධිෂ්ඨාන කර ගනිමු.

### සාරාංශය

අපරිහානීය ධර්ම හතකි. ඒවා මෙසේ ය.

1. නිතර නිතර රැස්වීම
2. සමගියෙන් රැස් ව, සමගියෙන් ක්‍රියා කොට සමගියෙන් විසිර යෑම
3. නො පැනවූ නීති නො පැනවීම, පැනවූ නීති කඩ නො කිරීම
4. වැඩිහිටියන්ට ගරු කිරීම හා ඔවුන්ගේ අවවාදවලට සවන් දීම
5. කාන්තාවන්ට හිරිහැර නො කිරීම
6. පූජනීය ස්ථානවලට ගරු කිරීම හා ඒවා නඩත්තු කිරීම.
7. පූජ්‍ය පක්ෂයට පහසුකම් සැලසීම හා උන් වහන්සේලාට ආරක්ෂාව සැලසීම

ආයතනයක දියුණුවක් ඇතිවන විට රටත් සමාජයත් දියුණු වේ. එයින් රටේ සෞභාග්‍යය ඇති වෙයි. මේ සඳහා ඉහතින් දැක්වූ වජ්ජීන් විසින් පිළිපදින ලද අපරිහානීය ධර්ම උපකාරි වේ. රටක නීතිය, සාමය, සාධාරණත්වය හා ආගමික දියුණුව සලසා ගැනීමටත්, සදාචාරාත්මක පරිසරයක් ගොඩනගා ගැනීමටත් මෙම ධර්ම තුළින් ලැබෙන්නේ මනා පිටිවහලකි.

## ක්‍රියාකාරකම්

01. අපරිහානීය ධර්ම හත පිළිවෙළින් ලියන්න.

02. ඉන් ඔබ කැමති එකක් කෙටියෙන් පහදන්න.

03. අපරිහානීය ධර්ම පවුලක දියුණුවට උපකාර කර ගත හැකි අන්දම පෙන්වා දෙන්න.

## පැවරුම

ශිෂ්‍ය සමිතියකට අදාළ කර ගත හැකි අපරිහානීය ධර්ම වෙන් කර ගෙන ඒවා පිළිපැදීමේ ප්‍රයෝජන වෙන වෙන ම දැක්වෙන වගුවක් පිළියෙල කරන්න.